# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# University of Sri Jayewardenepura
## බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
## External Degrees and Extension Courses Unit

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>My Number | Vidumini/USJ/25 | ලිපිනය<br>Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල<br>Post Box 10, Gangodawila<br>නුගේගොඩ, ශ්‍රී ලංකා<br>Nugegoda, Sri Lanka |
| ඔබේ අංකය<br>Your Number | | | |
| දුරකථනය<br>Telephone | 011-2801481, 011-3132496<br>011-2758731 | වෙබ් අඩවිය<br>Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස්<br>Fax | 011-2802753 | විද්‍යුත් තැපැල<br>E-mail | info.ext@sjp.ac.lk |


2026.08.05

මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනවියනි,

**<u>ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව - 2026/2027</u>**
**<u>සංගීත විෂයය සඳහා සිසුන් බඳවා ගැනීම වෙනුවෙන් පැවැත්වෙන යෝග්‍යතා පරීක්ෂණය</u>**

ඉහත උපාධි පාඨමාලාවේ සංගීත විෂයය හැදෑරීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා වන යෝග්‍යතා පරීක්ෂණය 2026 අගෝස්තු 15 වන දින පෙ.ව. 9.00 සිට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ශ්‍රී විමලධම්ම මන්දිරයේ බිම් මහලේ පිහිටි සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණවේද අධ්‍යයනාංශයේ දී පැවැත්වේ.

එදින සියලු ම අයදුම්කරුවන් **ගායනය/ වාදනය කිරීමට** සූදානම් ව පැමිණිය යුතු අතර **තමන් කැමති වාද්‍ය භාණ්ඩයක් රැගෙන** ආ යුතු ය. එමෙන් ම **සංගීත තාක්ෂණය සහ නිෂ්පාදනය පිළිබඳ වාචික පරීක්ෂණයකට** ද සූදානම් ව පැමිණිය යුතු ය.

සංගීත විෂයය හැදෑරීමට සුදුසුකම් ලැබීමට නම්, **<u>උක්ත යෝග්‍යතා පරීක්ෂණය සඳහා ඔබගේ පැමිණීම අනිවාර්යය වේ.</u>** මෙම පරීක්ෂණයෙන් අසමත් වූවහොත් හෝ මෙදිනට පැමිණිය නොහැකි වුවහොත් එම විෂයය කාණ්ඩය යටතේ ඔබ විසින් ලබා දී ඇති මීළඟ මනාපයට අවස්ථාව ලැබෙනු ඇත. **<u>කිසිදු හේතුවක් මත මේ සඳහා වෙනත් දින ලබා දීමක් සිදු නොකරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.</u>**

විභාග ප්‍රවේශ පත්‍රය අපගේ වෙබ් අඩවිය https://results.external.sjp.ac.lk/music_admission/ වෙත පිවිස තම ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර ලබා ගත හැකි අතර ඔබගේ අයදුම්පත් අංකයට නියමිත වේලාව සහ විභාග මධ්‍යස්ථානය එහි දක්වා ඇත. විභාග ප්‍රවේශ පත්‍රය සහ ජාතික හැඳුනුම්පත රැගෙන නියමිත වේලාවට මිනිත්තු 30කට පෙර විභාග ශාලාවට පැමිණීම අනිවාර්යය වන බව කරුණාවෙන් සලකන්න.

ඉහත පාඨමාලාව සඳහා අයදුම් කිරීමේ දී යොමු කළ ලිපි ලේඛනයන්හි **<u>මුල් පිටපත් පරීක්ෂාව</u>** ද මෙදින ම සිදු කෙරෙන බැවින් පහත සඳහන් උපදෙස් කියවා ඒ අනුව කටයුතු කරන මෙන් විශේෂයෙන් දන්වා සිටිමි.

## <u>ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාවේ අයදුම්කරුවන් සඳහා උපදෙස්</u>

### 1. ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය

### 1.1 Declaration Form

Declaration Form සහ ඡායාරූපය රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ ග්‍රාම නිලධාරිවරයෙකු/ සාම විනිසුරුවරයෙකු/ නීතිඥවරයෙකු හෝ රජයේ සේවයේ පරිපාලන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු අතර සහතික කරන නිලධාරියාගේ අත්සන සහ නිල මුද්‍රාව ඡායාරූපය මත ද තැබිය යුතු ය.

### 1.2 සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා රැගෙන ආ යුතු ලේඛන

- සම්පූර්ණ කරන ලද Declaration Form
- පාස්පෝර්ට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් (02) (3.5 cm × 4.5 cm) අවශ්‍ය වන අතර එක් ඡායාරූපයක පිටුපස ඔබගේ අයදුම්පත් අංකය සඳහන් කරන්න. අනෙක් පිටපත Declaration Formහි අලවන්න. නම්නීකරණ වැඩසටහනෙන් පසු එම ඡායාරූපය ම ශිෂ්‍ය තොරතුරු ගිණුමට (Student Profile) උඩුගත කළ යුතු ය. [මෙම ඡායාරූපයේ මෘදු පිටපතක් (Soft Copy) ඔබ සතු ව තිබිය යුතු ය.]
- උප්පැන්න සහතිකයේ මුල් පිටපත
- ජාතික හැඳුනුම්පත
- අ.පො.ස. උසස් පෙළ ප්‍රතිඵල ලේඛනයේ මුල් පිටපත සහ අයදුම්පත සමග ඉදිරිපත් කළ අනෙකුත් සහතිකයන්හි මුල් පිටපත්

ඉහත සියලු ලේඛන **2026.08.15** දින රැගෙන ආ යුතුය.

එම ලේඛනවල සහතික කරන ලද පිටපත් ද එදිනට ගෙනවිත් භාරදීම සිදු කළ යුතු අතර මුදල් ගෙවූ බැංකු ලදුපත අයදුම්පත සමග ඒවා නොමැති නම් එය ද රැගෙන ඒමට කටයුතු කරන්න.

**සැලකිය යුතුයි:**

අසත්‍ය තොරතුරු හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇති බව තහවුරු වුවහොත්, කිසිඳු මුදලක් ආපසු නොගෙවා ඔබගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ.

**1.3 පාඨමාලා ගාස්තු**

මුළු පාඨමාලා ගාස්තුව: රු. 195,000/-

| ගාස්තුව | මුදල (රුපියල්) | ගෙවිය යුතු කාල සීමාව | ගෙවීම සඳහා උපදෙස් |
|---|---|---|---|
| ලියාපදිංචි ගාස්තුව | 15,000.00 | **2026.09.19 දිනට පෙර ගෙවිය යුතු ය.** | **ලියාපදිංචි වන අවස්ථාවේ දී ගෙවිය යුතු ය.** (එක් එක් ශිෂ්‍යයා සඳහා වෙන වෙන ම ගිණුම් අංක පවතින බැවින් ඔබට අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතු ය. දිවයිනේ ඕනෑ ම මහජන බැංකු ශාඛාවකින් මෙම ගෙවීම සිදු කළ හැකි ය.) |
| පාඨමාලා ගාස්තු: පළමු වාරිකය | 60,000.00 | **2026.09.19 දිනට පෙර ගෙවිය යුතු ය.** | **පාඨමාලා ගාස්තු පළමු වාරිකය ලියාපදිංචි වන අවස්ථාවේ දී ගෙවිය යුතු ය.** (එක් එක් ශිෂ්‍යයා සඳහා වෙන වෙන ම ගිණුම් අංක පවතින බැවින් ඔබට අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතු ය. දිවයිනේ ඕනෑ ම මහජන බැංකු ශාඛාවකින් මෙම ගෙවීම සිදු කළ හැකි ය.) |
| පාඨමාලා ගාස්තු: දෙවැනි වාරිකය | 75,000.00 | **2026.12.31 දිනට පෙර ගෙවිය යුතු ය.** | උපාධි I පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර ගෙවිය යුතු අතර ගෙවීම සම්පූර්ණ නොකළ සිසුන් සඳහා මෙම පරීක්ෂණයට පෙනී සිටිය නොහැකි වේ.<br>පාඨමාලා ගාස්තු දෙවැනි වාරිකය ශිෂ්‍ය තොරතුරු ගිණුම (Student profile) හරහා සිදු කළ යුතු බැවින් ඊට අදාළ විස්තර විශ්වවිද්‍යාලය මගින් දැනුවත් කරනු ලැබේ. |
| පාඨමාලා ගාස්තු: තෙවැනි වාරිකය | 45,000.00 | **2027.06.30 දිනට පෙර ගෙවිය යුතු ය.** | උපාධි II පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර ගෙවිය යුතු අතර ගෙවීම සම්පූර්ණ නොකළ සිසුන් සඳහා මෙම පරීක්ෂණයට පෙනී සිටිය නොහැකි වේ.<br>පාඨමාලා ගාස්තු තෙවැනි වාරිකය ශිෂ්‍ය තොරතුරු ගිණුම (Student profile) හරහා සිදු කළ යුතු බැවින් ඊට අදාළ විස්තර විශ්වවිද්‍යාලය මගින් දැනුවත් කරනු ලැබේ. |

**2. ලියාපදිංචිය අවලංගු කිරීම**

උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ පසු ලියාපදිංචිය අවලංගු කරන්නේ නම් ඔබ වෙත නිකුත් කර ඇති ශිෂ්‍ය වාර්තා පොත සමග ඉල්ලීම් ලිපියක් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියාපදිංචිය අවලංගු කිරීමේ දී මුදල් නැවත ගෙවීමක් සිදු කරනු ලබන්නේ පහත සඳහන් හේතු සාධකවලට පමණි.

- ලියාපදිංචි වූ දින සිට සති දෙකක් ඇතුළත කරනු ලබන ඉල්ලීම් සඳහා පමණක් ගෙවන ලද ලියාපදිංචි ගාස්තුව (රු.15,000) හැර පාඨමාලා ගාස්තු මුදලින් 10%ක් රඳවාගෙන ඉතිරි මුදල් ආපසු ගෙවනු ලැබේ. මෙම කාල සීමාවෙන් පසු පාඨමාලා ගාස්තු නැවත ගෙවන ලෙස කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.
- යම් අයකු බාහිර උපාධි පාඨමාලාවකට ලියාපදිංචි වී ප්‍රථම වසර පරීක්ෂණය පැවැත්වීමට පෙර රාජ්‍ය විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයකු වශයෙන් ලියාපදිංචි වුවහොත්, ගෙවන ලද ලියාපදිංචි ගාස්තුව (රු.15,000) හැර පාඨමාලා ගාස්තුවෙන් 10%ක් රඳවාගෙන ඉතිරි මුදල් ආපසු ගෙවනු ලැබේ.

**3. ශිෂ්‍ය වාර්තා පොත**

ඔබගේ නම උප්පැන්න සහතිකයේ සඳහන් වන අයුරින් ම ලියාපදිංචිය සඳහා භාවිත කරනු ලබන අතර ශිෂ්‍ය වාර්තා පොතට සහ උපාධි සහතිකයට නම ඇතුළත් කරනු ලබන්නේ ද ඒ අයුරින් ම ය.

ලියාපදිංචියෙන් පසු නම වෙනස් වුවහොත්, උපාධි III පරීක්ෂණයට පෙර ඒ බව බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට දැනුම් දිය යුතු අතර ඊට අදාළ ලේඛන ද ඉදිරිපත් කළ යුතු ය.

**4. අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම**

පාඨමාලාවේ අධ්‍යයන කටයුතු 2026 ඔක්තෝබර් මාසයේ දී ආරම්භ කිරීමට නියමිත වන අතර 2029 වර්ෂය අවසන් වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. සිද්ධාන්ත දේශන (Theory Seminars) මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ පැවැත්වෙන අතර ප්‍රායෝගික විෂයයන් සඳහා භෞතික දේශන (Practical Seminars) පැවැත්වේ. පවත්වන ලද සිද්ධාන්ත දේශනවල පටිගත කිරීම් (LMS - learnext.sjp.ac.lk) වෙත උඩුගත කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවල දී ඒවා නැරඹිය හැකි ය.

**සැලකිය යුතුයි:**

- ලියාපදිංචිය සඳහා තෝරා ගත් සිසුන් සිය ගෙවීම් 2026.09.19 දිනට පෙර සම්පූර්ණ කළ යුතුය.
- ලේඛන සත්‍යාපනය කර ගැනීමෙන් පසු ගෙවීම් විස්තර ලබා දෙන අතර ඉන් පසුව පමණක් ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ වේ.
- මේ සම්බන්ධ සියලු නිවේදන විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවිය සහ LMS මගින් පමණක් ප්‍රකාශයට පත් කෙරේ.

පාඨමාලා වාරික ගෙවීම්, සම්මන්ත්‍රණ කාලසටහන්, විභාග කාලසටහන්, විභාග ප්‍රවේශ පත්‍ර, ලියාපදිංචිය අලුත් කිරීම සහ උපාධි ප්‍රදානෝත්සවය සම්බන්ධ තොරතුරු යනාදී සියලු ම දැනුවත් කිරීම් www.external.sjp.ac.lk වෙබ් අඩවිය, LMS සහ Student Profile හරහා පමණක් දැනුම් දෙනු ලැබේ.

ලිපි මගින් දැනුවත් කිරීම් සිදු නොවන බැවින් වෙබ් අඩවිය, LMS සහ Student Profile නිරන්තරයෙන් පරීක්ෂා කරන ලෙෂ විශේෂයෙන් දැනුම් දෙමි.

**සහකාර ලේඛකාධිකාරී**

**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**

- විමසීම් - 011 3485 402 (සතියේ දිනවල පෙ.ව. 8.30 - ප.ව. 4.15)

**Application Number** [ ]

**External Degrees and Extension Courses Unit**
University of Sri Jayewardenepura, Sri Lanka

## Declaration form for Bachelor of Arts (General) External Degree – 2026/2027

උප්පැන්න සහතිකයට අනුව සම්පූර්ණ නම (සිංහලෙන්)

..........................................................................................................................................................

..........................................................................................................................................................

Full Name according to the Birth Certificate (Block Letters)

..........................................................................................................................................................

..........................................................................................................................................................

මුලකුරු සහිතව නම (සිංහලෙන්) :....................................................................................................

Name with Initials (Block Letters) :...............................................................................................

ස්ථිර ලිපිනය (සිංහලෙන්) :...............................................................................................................

..........................................................................................................................................................

Permanent Address (English) :.......................................................................................................

..........................................................................................................................................................

ස්ථාවර දුරකථන අංකය : .............................................. ජංගම දුරකථන අංකය: ..............................................
Residence Mobile

ජාතික හැඳුනුම්පත් අංකය
National Identity Card No :...............................................................................................

උපන් දිනය
Date of Birth :...............................................................................................

විද්‍යුත් ලිපිනය
Email :...............................................................................................

- ❖ කරුණාකර ඔබගේ වර්ණ ඡායාරූපය මෙහි අලවන්න
  Please paste your photograph here.
  - ඡායාරූපය 3.5 X 4.5cm ප්‍රමාණයේ සුදු පසුබිම සහ jpeg වර්ගය විය යුතුය. (සහතික කරණු ලබන නිළධාරියාගේ අත්සන සහ නිලමුද්‍රාව ඡායාරූපය මතද තබා සහතික කළ යුතුය.)
    Colour Photograph should be 3.5 X 4.5 cm size with white background.

**Photograph**

**3.5 X 4.5**

**මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් දැනට මෙම විශ්ව විද්‍යාලයෙහි කිසිදු බාහිර උපාධියක් හදාරන්නේ නැති බව සහතික කරමි. මාගේ ඉල්ලුම් පත්‍රය පිළිගනු ලැබුවහොත් විශ්වවිද්‍යාලයේ බාහිර අයදුම්කරුවන් පාලනය කරන නීති රෙගුලාසිවලට මම අවනත වෙමි.**
I hereby certify that the information provided by me in this application is true and accurate. I certify that I'm currently not pursuing any external degree from this university. If my application is accepted, I agree to abide by the rules and regulations governing external applicants of the University.

…………………….. …………………………
Signature of Applicant Date

- ❖ **සහතික කිරීම (Attestation)**

**මා දන්නා පහත නම් කර ඇති අපේක්ෂකයා සහ අමුණා ඇති ඡායාරූපය ඔහුගේ/ඇයගේ බව සහතික කරමි.**
I certify that the above named candidate who is known to me and certify attached photograph owned to his/her.

**නම** (Name) :

**තනතුර** (Designation) :

**අත්සන** (Signature) :

**දිනය** (Date) :

…………………………..
Official Seal

- ❖ රජයේ විද්‍යාලක විදුහල්පතිවරයෙකු, ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාම විනිසුරුවරයෙකු, නීතිඥයෙකු, රාජ්‍ය සේවයේ පරිපාලන නිලධාරියෙකු හෝ රජයේ පිළිගත් ආයතනයක මාණ්ඩලික නිලධාරියෙකු විසින් අත්සන සහ නිලමුද්‍රාව තබා සහතික කළ යුතුය.
  **Signature & Photograph should be attested by Grama Niladhari of the Division/Head of a Government or Approved School/ a teacher or an executive officer of a University, or a Justice of the peace or a Staff officer / Government Department or a person of similar status.**

**Office use only Checked By : ………………….**